14 2016 02.24 අද

# ජනවාරියේ ජාතික පාරිභෝගික මිල දර්ශකය නිකුත් කෙරේ

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව 2016 ජනවාරි මස ජාතික පාරිභෝගික මිල දර්ශකය 112.0 ලෙස ගණනය කර ඇතැයි එම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය අමර සතරසිංහ මහතා පවසයි. ඒ අනුව ජනවාරි මාසයේ දර්ශකය දෙසැම්බර් මාසයේ දර්ශකය (113.2) හා සංසන්දනය කල විට 1.2ක දර්ශකාංක අඩුවීමක් හා ප්‍රතිශතයක් ලෙස 1.1% ක අඩුවීමක් වාර්තා වන බවත් ඔවුන් පෙන්වා දෙයි. මේ සඳහා ආහාර කාණ්ඩයේ වටිනාකමේ වෙනස 1.03% කින් හා ආහාර නොවන කාණ්ඩයේ වටිනාකමේ වෙනස 0.02% කින් අඩුවීම බලපා ඇත.

ජාතික පාරිභෝගික මිල දර්ශකයට අනුව, 2016 ජනවාරි මාසය සඳහා වාර්ෂික උද්ධමනය -0.7' ලෙස ගණනය කොට ඇත. එහිදී පසුගිය දෙසැම්බර් මාසය සඳහා එම අගය 4.2% ක් ලෙස වාර්තා වූ බවත් අධ්‍යක්ෂ ජනරාල්වරයා සඳහන් කරයි. එසේම 2016 ජනවාරි මාසයේ භාණ්ඩ පැසෙහි වටිනාකම (රු. 35,997.76), 2015 ජනවාරි මාසයේ භාණ්ඩ පැසෙහි වටිනාකමට (රු. 36,272.14) සාපේක්ෂව අඩුවූ බැවින් 2016 ජනවාරි මාසය සඳහා අවධමනයක් ඇතිව තිබෙන බවත් දෙපාර්තමේන්තුව පවසයි.

DEPARTMENT OF CENSUS & STATISTICS
LIBRARY
COLOMBO